# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2218/38 - 2021 මාර්තු මස 09 වැනි අඟහරුවාදා - 2021.03.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම්

### 1949 අංක 58 දරන මුදල් නීති පනත

1949 අංක 58 දරන මුදල් නීති පනතෙහි 68 වන වගන්තිය සමග එක්ව කියවිය යුතු 10 (c) වන වගන්තිය යටතෙහි සාදනු ලබන රීති

මහාචාර්ය ඩබ්ලිව්. ඩී. ලක්ෂ්මන්,
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති.

2021 මාර්තු මස 9 වැනි දින,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ දී ය.

**අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන්වා ගැනීම**

1. මෙම රීති "2021 අංක 2 දරන අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු ය.

2. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මගින් නිකුත් කල සහ 2021 පෙබරවාරි මස 18 වැනි දිනැති අංක 2215/39 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* ප්‍රකාශයට පත් කළ 2021 අංක 1 දරන අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති, එහි 4 වන රීතිය ඉවත් කිරීමෙන් සහ පහත සඳහන් රීතිය ඒ වෙනුවට ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"4. සෑම භාණ්ඩ අපනයනකරුවෙකුම, ඉහත 3 වන රීතිය යටතේ ඉල්ලා ඇති පරිදි අපනයනය මගින් ලද මුදල් ලැබී දින දාහතරක් (14) ඇතුළත, බලපත්‍රලාභී බැංකුවක් මගින් එකී අපනයනය මගින් ශ්‍රී ලංකාවට ලද මුළු මුදලින් සියයට විසි පහක ප්‍රතිශතයක් (25%) ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කළ යුතු ය.

කෙසේ වෙතත්, ඉහත සඳහන් පරිවර්තනය කරන දිනය ඉහත 3 (i) රීතියට අනුව ශ්‍රී ලංකාවට අපනයන ආදායම ලැබීමට නියමිත දිනයට වඩා පසු දිනයක් නොවිය යුතුය. (එනම්, භාණ්ඩ නැව්ගත කළ දින සිට දින එකසිය අසූවකට (180) නොවැඩි දිනයක් විය යුතුය.)".

03 - 657